


# පාරවල් අයිනේ අතහැර දමන ලද ආදරණීය ජනයාගේ මළ සිරුරු දුටිමි

**සන්නසට සකස් කරන්නේ ශ්‍රීලාල් සෙනෙවිරත්න**

දෙදහස් අට වසරේ නොවැම්බර් මස විසිතුන්වන දින හමුදාව කිලිනොච්චියට ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කළේය. දෙදහස් නවය වසරේ ජනවාරි මස දෙවෙනි දින කිලිනොච්චි නගරයත්, ඒ ආශ්‍රිත ප්‍රදේශයත් හමුදාව විසින් අත්පත් කරගන්නා ලදි. හමුදාවට තම ප්‍රදේශයට ඇතුළුවීමට හොඳින් ඉඩ දී පසුව හමුදාවට ක්ෂණික විශාල ප්‍රහාරයක් එල්ල කිරීමේ සැළැස්මක් නායකතුමා සතුව පවතින බවට විශ්වාසය සෙන්පතිවරු, සටන්කාමියෝ පමණක් නොව, සාමාන්‍ය ජනතාව අතරේ පවා පැවතිණ.

''හොඳටම ඇතුළට ආවට පස්සේ තමයි ගහන්ඩ බලාගෙන ඉන්නේ'' යන විශ්වාසය විදෙස්ගත දෙමළ ජනතාව අතරෙහි ද පැතිර පැවතිණ. දේශපාලන අංශය භාරව උන් තමිල් චෙල්වන්ගේ ශරීරාක්ෂකයෙකු ලෙසින් කටයුතු කර තමිල් චෙල්වන්ගේ මරණයෙන් පසුව මහත් දක්ෂතා පූර්ණ ප්‍රහාරක සටන්කාමියෙකු බවට පත්වූ ඊළප්පිරියන් කිලිනොච්චියේ දී අවසන් වතාවට මා හමුවූ අවස්ථාවේ නායකතුමා තමන් සමඟ පැවසූ අදහසක් මට හෙළිදරව් කළේය.

''සේරම හිතාගෙන ඉන්නේ මගේ අතේ තමයි සේරම තියෙන්නේ කියලයි. නමුත් මගේ අතේ කිසිම දෙයක් නෑ. මගේ අත හිස්'' යැයි කියමින් නායකතුමා තම අත දිගහැර දැක්වූ බව කියමින් ඊළප්පිරියන් තම අත දිගහැර පෙන්වමින් පැවසුවේය. ''නායකතුමා එහෙම කියද්දි, අපිට කරන්ඩ පුළුවන් දේ මොකක්ද?'' යැයි වේදනාවෙන් පවසා සමුගෙන ගිය ඊළප්පිරියන් නම් වූ තරුණ සටන්කාමියා දින කිහිපයකට පසුව මහාභාරතයේ සඳහන් වන අභිමන්‍යු මෙන් ධීර ශක්තියෙන් යුතුව කිලිනොච්චියේ දී තමන්ව වටකරගත් හමුදාව සමඟ සටන් කර වීර මරණය වැළඳ ගත්තේය.

කිලිනොච්චිය ආරක්ෂා කරගැනීමේ විශාල හමුදාමය ක්‍රියා මාර්ගයක් කොටින් විසින් සිදු කළ නොහැකි විය යන සත්‍ය පිළිගත යුතුය. සාම සාකච්ඡා කාල වකවානුවේදී ගොඩනැංවූ එම නගර මධ්‍යයෙහි වූ විශාල ජල ටැංකිය සංවිධානය විසින් පුපුරුවා දමන ලදි. 1996 වසරේ හමුදාවේ සත්ජය මෙහෙයුමේදී ද මෙම ස්ථානයෙහිම තිබූ ජල ටැංකිය කොටින් විසින් පුපුරුවා හරින ලදි. 2008 වසරේදී කිලිනොච්චිය නැවතත් විනාශ විය. ජනතාව අවතැන්ව කිලිනොච්චියෙහි සිට කිලෝමීටර දහතුනක් ඔබ්බෙන් වූ ධර්මපුරයට ගියෝය.

දේශපාලන අංශය භාරව උන් නඩේසන්ගේ බලවත් ඉල්ලීම පරිදි නායකතුමාගේ නියෝගයට අනුව මාස හයකට පමණ පසුව 2008 වසරේ ජනවාරියෙහි සිට මම නැවතත් කාන්තා අංශය භාරව කටයුතු කිරීමට පටන් ගත්තෙමි. දේශපාලන උපදේශක ඇන්ටන් බාලසිංහම් පිළිකා රෝගය හේතුවෙන් 2007 වසරේදී මිය ගිය පසු සිදුවූ දේශපාලන අංශය භාරව සිටි තමිල් චෙල්වන්ගේ හදිසි මරණය වනාහි බටහිර රටවල සාම ක්‍රියාකාරීන්ට කොටි සංවිධානය සමඟ පැවැති සුළු මට්ටමේ සමීප ඍජු සම්බන්ධතා පවා අහිමි කිරීමට හේතු විය.

තමිල් චෙල්වන්ගේ අභාවයට පසුව දේශපාලන අංශය භාරව පත්කළ නඩේසන් තමිල්නාඩුවේ සිටින ඊළාම් හිතවාදී දමිළ බලවේග සමඟ කිට්ටු සම්බන්ධතා පවත්වාගෙන පැමිණියේ ය. ඔවුන්ගේ දේශපාලනික ක්‍රියාකාරකම් සංවිධානය අර්බුධයෙන් ගලවා ගනු ඇතැයි යන මහත් වූ විශ්වාසය ඔහු සතු විය. 2009 වසරේදී පැවැත්වීමට නියමිතව තිබූ මැතිවරණයේ දී ජයලලිතා මහ ඇමැති ධුරයට පත්වීමත් සමඟ ඇය ඉන්දීය මධ්‍යම රජයට බලපෑම් කර ලංකා රජය සහ කොටි සංවිධානය අතර සටන් විරාමයක් ඇති කිරීමේ වාතාවරණයක් ඇති වෙනු ඇතැයි යන විශ්වාසයක් කොටි නායකත්වය සතුව තිබිණ. ඒ තරම් දුරට නඩේසන් තමිල්නාඩුවේ දේශපාලකයන්ගේ වචන විශ්වාස කළේය. එහෙත් එවැනි ක්ෂණික වෙනසක් තමිල්නාඩුවේ සිටින ආධාරක බලවේගවලට ඇති කළ හැකිය යන විශ්වාසය මා තුළ ඇති වූයේ නැත. ඔවුන්ගේ ආවේගශීලී කතා සහ මුත්තුක්කුමාර්, සෙන්කදීර් වැනි පිරිස්වල ගිනි තබාගැනීම් වැනි පරිත්‍යාග ඉන්දීය මධ්‍යම ආණ්ඩුවේ අවධානය යොමු කිරීමට සමත් වෙතැයි මම බලාපොරොත්තු නොවූවෙමි.

තමිල්නාඩුවේ ජනතාව අතර ප්‍රචලිත දේශපාලන පක්ෂ නායකයන්ගේ දෙමළ ඊළාම් සහයෝගිතා ඝෝෂාවන් මැතිවරණ කාලයේ තම ඡන්ද පෙට්ටි පිරවීමට පමණක් ප්‍රයෝජනයට ගන්නා ඒවාය යන්න අමතක කර මහ සයුරේ ගසා ගෙන යද්දී කෙන්දක් හෝ අසුවේදෝ යන බලාපොරොත්තුවෙන් සිටි කොටි සංවිධානයේ නායකතුමා වන ප්‍රභාකරන් යුද්ධයේ අවසන් අදියරේදී පරාජය තුළ තනිකර දමා තිබුණි. 2008 වසරේ නොවැම්බර් මාසයේ ලංකාවේ හමුදාව පුනගරි ප්‍රදේශය අත්පත් කරගැනීමත් සමඟ පරන්තන් කරා ළඟා වූ හමුදාව දෙසැම්බර් 31 වන දින අලිමංකඩට ඇතුළුව යාපනය දක්වා ගොඩබිම් මාර්ගයත් එක් කරමින් මුළු ප්‍රදේශයම අත්පත් කරගෙන කිලිනොච්චිය බලා ගමන් කරන්නට විය. 2009 වසරේ ජනවාරි මාසයේ දෙවන දිනයේ දී කොටින්ගේ සාම කාලයෙහි අග නගරය වූ කිලිනොච්චිය සම්පූර්ණයෙන්ම හමුදාව අතට පත්විය. ආයුධ බිම දමා යටත් වන මෙන් ලංකාවේ ජනාධිපති, මහින්ද රාජපක්ෂ විමුක්ති කොටි සංවිධානය වෙත විවෘත දැනුම්දීමක් කළේය.

එයට පසුව කිසිම දරුණු ගැටුමකින් තොරව ධර්මපුරය ද හමුදාව අත්පත් කරගත්තේය. සුදන්දිර් පුරම්, උඩෙයාර් කට්ටු, වල්ලිපුරම් ප්‍රදේශයන් ජනයාගෙන් පිරී යන්නට විය. මෙම අවස්ථාවේදී විශ්වමඩු වැවේ ඇණිකට්ටුව කළු කොටි ප්‍රහාරයකින් පුපුරුවා හැර හමුදාව ජලයෙන් යටකර දැමීමේ සංවිධානයේ සැලැස්ම ද පරාජයට පත්වීය. සිය ගණනක් හමුදාව මියගිය බවට කොටි හඬ ගුවන් විදුලිය අසත්‍ය පුවත් ප්‍රචාරය කර ජනයාගේ මානසික තත්ත්වයෙහි සුළු හෝ විශ්වාසයක් ඇති කළ හැකිය යනුවෙන් උත්සාහ දැරුවේය. තවදුරටත් කුමන දිහාවක් කරා කුමන බලාපොරොත්තුවකින් ගමන් කරන්නේ ද යන්න තේරුම් ගත නොහැකිව ජනයා මහත් ඛේදවාචකයකට මුහුණ දෙමින් උන්නෝය. මහජනතාවට ස්ථිර විශ්වාසයක් ඇති කළ නොහැකි තත්ත්වයට කොටි සංවිධානය පත්ව උන්නේය.

සංවිධානයේ කාලතුවක්කු හමුදා වෙත ප්‍රහාර එල්ල කිරීමට සුදුසු ස්ථානයක් නොමැතිව සුදන්දිරන්පුරම්, වල්ලිපුරම්, දේව්පුරම් යනාදි ස්ථානවල ස්ථානගත කර තිබුණි. කොටින්ගේ කාල තුවක්කු රඳවා ඇති ස්ථාන වෙත හමුදාව විසින් එල්ල කරන ලද ප්‍රතිප්‍රහාර හේතුවෙන් ද අති විශාල පිරිසක් මරණයට පත්විණි. කුමන ජනතාව වෙනුවෙන් සටන් කිරීමට ගියද එම ජනයාගේ රුහිරු පොළොව පුරා ගලා ගියේය. අප සම්බන්ධව සිටි යුද්ධයෙහි මගේ හිත සැනසීමට සමත් වූ කිසිම හේතු දැක්වීමක් නොවීය.

එම වාතාවරණය තුළ මම ආයුධ සන්නද්ධ අරගලය පිළිකුල් කළෙමි. සංවිධානයේ නායකත්වය විසින් ගන්නා ලද තීරණ හේතුවෙන් ජාතියම විනාශ වී යන තත්ත්වයක් උදාවී තිබුණි. තිස් වසරක අරගලය තුළ දී ජනතාව ඝාතනයට පත් වී ලක්ෂ ගණන් විනාශ වී ගොස් ඇත. කෝටි ගණනක වස්තුව අහිමි වී ඇත. ලක්ෂ ගණනකගේ අනාගතය විනාශ වී ඇත. මේ සියල්ලම විමුක්තිය උදෙසා ජනයාගේ කැප කිරීම්ය. එහෙත් අපේ ජනතාව විනාශ වූ පසුව මේ ප්‍රදේශය කා වෙනුවෙන්ද? මේ විමුක්තිය කා වෙනුවෙන් ද? යුද්ධයේ අවසන් අදියරේ දී අපේ ජනතාව අත්වින්ද ඛේදවාචකයන් පිළිගැනීමට නොහැකි ය. අපගේ අරගල ක්‍රමය ඉතාමත් වැරදිය යන්න මම මගේ ඇස් ඉදිරිපිට අත්දැකීමෙන් දුටුවෙමි. අපගේ ආදරයට ලක්වූ ජනතාව අපේ ඇස් ඉදිරිපිටම පාරවල් අයිනේ මළ සිරුරු ලෙසින් අත්හැර දමා තිබුණි. එයට සටන්කාමී සංවිධානය එක් හේතුවක් විය. එහෙම නම් මෙම අරගලය කා වෙනුවෙන් ද?

දීර්ඝ කාලීන අත්දැකීම් ඇති සටන්කාමීහු පිළිකුලේ උච්චස්ථානයට පත්ව උන්හ. අනිවාර්ය බඳවාගැනීම්වල සිටි නවක සටන්කාමියෝ බොහෝ දෙනෙක් සෑහෙන තරමේ පුහුණුවීම් නොමැති හේතුවෙන් සටන් පෙරමුණෙහි දරාගත නොහැකි ආයුධ අතහැර දමා නිවෙස් කරා යාම බහුල විය. ජන ගැවසීම් අඩුව පැවැති ප්‍රදේශ යුද්ධ භූමි බවට පත්වී තිබුණි. මොහොතින් මොහොත මරණ විලාපය නැඟෙමින් පැවැති අතර, කොටි සංවිධානය ඉතාමත් අනුවේදනීය අයුරින් තම අවසන් දින කීපය ගත කරමින් තිබුණි.




